# "අපට පුළුතේ මගක් ඇතේ"

## තරුණසිත්ට අත දෙන්නේ මෙලෙසින්

"අපේ තරුණ පරපුරේ දියුණුව පිළිබඳව බොහෝ දෙනෙකු තුළ අතීතයේ සිටම උනන්දුවක් තිබුනා. ඒ සඳහා විවිධ සාකච්ඡා වාද විවාද ආදියත් පැවැත් වුනා පමණක් නොව, විවිධ කාලවලදී නොයෙකුත් සැලසුම් ද සකස් වුනා. එහෙත් මෙරටේ තරුණ පරපුරේ ප්‍රගතිය වෙනුවෙන් සත්‍ය වශයෙන්ම සිදු වන්නේ කුමක් ද? ඒ ප්‍රශ්නයට නිසි පිළිතුරු දිය හැකි බලධරයෙකු සමඟ කළ සාකච්ඡාවකි මේ".



අපේ තරුණ පරපුර වෙනුවෙන් වෙන්වුන උසස්ම රාජ්‍ය ආයතනය වන තරුණ හා රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය බිහිවුනේ, අපේ තරුණ පරපුරේ විශාල බලාපොරොත්තුවක් මල් පල ගන්වමින්, තරුණ පරපුරේ සිහින සැබෑ කිරීම සඳහා නිතිපතා ඉමහත් වෙරක් දරණ මෙම අමාත්‍යාංශයේ කටයුතුන් තරුණ පරපුරේ අභිවෘද්ධිය සඳහා අපේ රජය අනුගමනය කරන ප්‍රතිපත්තින් පිළිබඳව විමසීමට 'ගොවි ජනතාව' මුණ ගැසුනා විශිෂ්ටතම තරුණ පරිපාලකයෙකු ජේ. ජේ. රත්වත්ත මහතා තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ධූරය වසර එකහමාරකට අධික කාලයක් දරමින් රාජ්‍ය පාලනයෙහි විශිෂ්ට දක්ෂතා දක්වූ රත්වත්ත මහතා, තරුණ පරපුරේ සිහින සැබෑවක් බවට පත් කරන' අනෙක් රාජ්‍ය ආයතනය වන ජාතික තරුණ සේවා සභාවේ සභාපති ධූරයද සත් වසරකටත් අධික කාලයක් දරමින් සිටිනවා.

මෙම තරම් රාජකාරි බහුල රත්වත්ත මහතා, අප හා පිළිසඳරක යෙදෙන්නට කාලය වෙන් කළේ තරුණ පරපුරේ අභිවෘද්ධිය උදෙසා තමන් තුළ ඇති නිසඟ කැපවීම පෙන්වමිනි. පුවත්පත් කලාවේ සම්ප්‍රදායානකූලව, පළමු වෙන් අසන ලද ප්‍රශ්නයට තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයක් පිහිටුවීමට හේතුවූ කරුණ පහදමින් රත්වත්ත මහතා පිළිතුරු ආරම්භ කළේ මේ අයුරින්:

"ලංකාවේ ජනගහන සංඛ්‍යා ලේඛන අනුව සියයට 30 ත් 35 ත් පමණ කොටසක් අවුරුදු 15 ත් 30 අතර වන තරුණ පරපුරට අයත්. පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් වැඩි පිරිසක් මෙම කොටසට ඇතුළත් වූවිට මෙම සංඛ්‍යාව තවත් වැඩි වෙනවා. මේ නිසා මෙරටේ ජනගහණයෙන් ඉතා වැදගත් කොටසක් වන තරුණ පරපුරේ ප්‍රශ්න ඔවුන්ගේ අභිලාෂයන් හා අදහස් ඉදිරිපත් කිරීමට තරුණ පරපුරේ අභිවෘද්ධියට හේතුවන ප්‍රතිපත්ති හා රාජ්‍ය ක්‍රියා මාර්ග ඇති කිරීමත් රටේ පාලනයට තරුණ පරපුර සහභාගි කරවා ගනු පිණිසත් අමාත්‍ය මණ්ඩල මට්ටමේ ඇමති ධූරයක් ඇති කිරීමේ අවශ්‍යතාවය රජයට පැහැදිලිවීම නිසායි තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ඇති කළේ"

ඉන් පසුව අපෙන් නැඟුනෙවන ප්‍රශ්නයට රත්වත්ත මහතාගේ පිළිතුර වූයේ මෙයයි. ලංකාවට තරුණ ප්‍රතිපත්තිය කුමක්දයි යන ප්‍රශ්නයට දිය හැකි පිළිතුර,

"එම තරුණ තරුණියන්ගේ ආදායම් මට්ටම දියුණු කර ගැනීම සඳහා හැකියාව ඔවුන්ට ලබා දීමයි. විවිධ වෘත්තීයන් සඳහා ඔවුන් පුහුණු කෙරෙන මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක වන්නේ අපේ අමාත්‍යාංශ ඇතුළු අමාත්‍යාංශ කීපයක් එකතුවී. මෙයට හේතු වුනේ අපේ මෙතෙක් පැවැති අධ්‍යාපන ක්‍රමයේ දුර්වලතාවයක්. අපේ රටේ දරුවෙක් අවුරුදු ගණනාවක් පාසැල් අධ්‍යාපනය ලබා සමාජයට පිවිසෙන අවස්ථාවේදී ඔහුට එම දැනුම උපයෝගී කර ගෙන සමාජයට උපරිම අන්දමින් සේවය කිරීමට නොහැකි වී තිබෙනවා. මෙලෙස වී ඇත්තේ අධ්‍යාපන ක්‍රමයේ ඇති දුර්වල තාවය නිසා, අපේ වැඩ පිළිවෙලේ අරමුණ වන්නේ එම තරුණ තරුණියන්ව සමාජයේ වගකීමක් ඇතිව කටයුතු කිරීමට හැකියාව ලබා දීමයි".

"එහෙත් මෙම පුහුණු වැඩ පිළිවෙල සෑම දෙනාටම රැකියා වක් ලබාදීමේ වැඩ පිළිවෙලක් නොවේ. එයින් අදහස් කරන්නේ තරුණ තරුණියන් සිය නිවසේ සිට හෝ යම් කටයුත්තක නියැලී ඔහුගේ ආදායම් මට්ටම වැඩි කිරීමයි".

මෙබඳු රැකියා පුහුණු ලබා දෙන්නේ කුමන ආයතන වලින්ද?

"එය සිදු කරන්නේ අමාත්‍යාංශ ගණනාවක් එක්වෙලා කම්කරු තරුණ කටයුතු හා කෘෂිකර්ම වැනි අමාත්‍යාංශ වල ඇති පුහුණු මධ්‍යස්ථාන මගින් තරුණ තරුණියන්ට ඒ ඒ ක්ෂේත්‍රවල පුහුණුවක් හා දැනුමක් ලබා දෙනවා. අපේ පවතින අධ්‍යාපන ක්‍රමයේ අදහස සියලු දෙනාම විශ්ව විද්‍යාලවලට ඇතුලත් කිරීමයි. නමුත් පාසැල් සිසුන්ගෙන් විශ්ව විද්‍යාලයට යන්නේ සියයට එකයි. අමතක කර ඇති අනෙක් 99 දෙනාටම යහපත් අනාගතයක් උදා කෙරෙන මෙම වැඩ පිළිවෙල එක් අතකින් අධ්‍යාපන ක්‍රමයෙහි ඇති අඩුපාඩු වක් - දුර්වල තාවයක් සපිරීමක් ලෙසත් සලකන්න පුළුවන්. රජයේ නව අධ්‍යාපන ප්‍රතිපත්තිය ඇතුළත් අධ්‍යාපන ධවල පත්‍රිකාවේ වැඩ පිළිවෙල ආරම්භ වන විට, මෙබඳු පුහුණුවක් පාසැල් විෂය මාලාව මගින් අපේ අනාගත පරපුරට ලබා ගැනීමට හැකිවනු ඇත."

තරුණ පරපුරේ ප්‍රශ්න ආදායම් මාර්ග වැඩි කිරීමෙන් පමණක්ම විසැඳිය හැකිද? "ආදායම් වැඩි කිරීමෙන්ම ඔවුන්ගේ ප්‍රශ්න විසඳේ යැයි කියන්න බැහැ. සංස්කෘතික අංශයෙන්, උදාහරණ වශයෙන්, සංගීතය, නැටුම්, ක්‍රීඩා, කලාව, පොත්පත් කියවීම ආදී අංශත් ඔවුන්ට අවශ්‍යයි. ඒ නිසා කලාත්මක කුසලතා ඇති තරුණ තරුණියන්ට ඒ සඳහා අවස්ථාවක් ලබා දීමත් වැදගත්. මේ සඳහා ජාතික තරුණ සේවා සභාව විශේෂ වැඩ පිළිවෙලක් ආරම්භ කර තියෙනවා. එහෙත් මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නේ ආර්ථික අංශය අමතක කර නොවේ. ඒ දෙඅංශ යමසමබරව තබා ගෙනයි. එම වැඩ පිළිවෙල අනුව සහජ දක්ෂතා දියුණු කර සමාජයේ යම්කිසි තත්ත්වයකට පැමිණීමට එමගින් ඉඩකඩ ලැබෙනවා. මෙරටේ සිටින සියලුම තරුණ තරුණියන්ට මේ මගින් සේවයක් කිරීම අපහසු වුවත්, කලා ක්ෂේත්‍රවල තමන්ට ඉදිරියට ඒමට හැකි බවට තරුණ පරපුරට හැඟීමක් හා බලාපොරොත්තුවක් ඇතිවීම හා ධෛර්යයක් ඇති කිරීම මෙහි අරමුණයි. මේ වැඩ පිළිවෙල නිසා මෙම ක්ෂේත්‍ර වල මෙතෙක් අවස්ථාවක් නොලැබුන තරුණ තරුණියන්ට දැන් අවස්ථාවක් ලැබී ඇතිබව අපට ලැබෙන ප්‍රති ප්‍රචාරයන්ගෙන් පැහැදිලි වෙනවා. මේ මගින් මෙතෙක් මෙරටේ තරුණ තරුණියන්ගේ සිත්වල තිබූ 'අපට පුංචි මගක් නැතේ' යන අදහස වෙනස් කරලා ඇතැයි පෙනී යනවා."

මෙරටේ දස අත විසිරී සිටින තරුණ පරපුරේ සහජ දක්ෂතා ඇති තරුණ තරුණියන්ට අත දෙන මෙම වැඩ පිළිවෙල සංවිධාන කරන ආකාරය විස්තර කළ රත්වත්ත මහතා.

"දිවයිනේ පුළුල්ම සංවිධාන යෞවන සමාජයයි. දැන් දිවයිනේ යෞවන සමාජ 2500 ක් පමණ පිහිටුවා තිබෙනවා. ලබන වසරේදී එය දෙගුණ කිරීමට අදහස් කරනවා. 1915 දී එනම් ජාත්‍යන්තර තරුණ වර්ෂයේදී මෙම සමාජ සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම අවම වශයෙන් එක් යෞවන සමාජයක් හෝ පිහිටුවීම අපේ අරමුණයි.

"එහෙත් මෙම සමාජ නමට පමණක් සීමාවූ සංවිධාන බවට පත් කිරීම අපේ අදහස නොවේ. ඒවා අඩුතරමින් සියයට 60 ක් වත් ක්‍රියාකාරී වීමයි. අපේ ඉලක්කය ඒ සංවිධාන මගින් තමයි, විවිධ අංශවලට දක්ෂතා ඇති තරුණ තරුණියන් තෝරා ගන්නේ".

මෙසේ කරන්නේ ඇයි යන ප්‍රශ්නයට පිළිතුරු කළ ඒ මහතා:

මේ ගැන කථා කරන විට එකක් තියෙන්නේ හැම කෙනාටම රජයේ හෝ සංස්ථාවල රැකියා දෙන්න බැරි තත්ත්වයක් උදාවෙලා. අපේ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල, සංස්ථාවල නැත්නම්, නිදහස් වෙළඳ කලාප වලට සේවකයන් දැමීමේ සීමාවක් තියෙනවා. අපේ රටේ ඒ සුදුසුකම් තියෙන තරුණ කොටස් වලට එවැනි රැකියාදෙන්න බැහැ. ඒකට

වෙනත් ක්‍රම තිබෙනවා. තාක්ෂණ ක්‍රම, විශේෂයෙන් අද ලංකාවේ රූපවාහිනී, රේඩියෝ ආදී ක්‍රම ප්‍රචලිත වෙලා තියෙනවා. ඒවාගේ දේවල් අළුත් වැඩියා කරන කුඩා කම්හල්, වැඩපලවල් වල රැකියා ලබා ගන්න පුළුවන්. මේ හැකියාව ලබා ගත්තට පස්සේ තනියම, යම්කිසි වැඩ සටහනක් පටන් ගන්න පුළුවන්. අපි ඔවැනි ප්‍රශ්න නිසා තමා තරුණයන්ගේම ව්‍යාපාරයක් පටන් ගත්තේ. දැන් අපි නිස්කෝ කියාල සමූහ ව්‍යාපාරයක් පටන් අරන් ඉන්නවා. දැනට සාමාජිකයෝ 5000 ක් විතර ඉන්නවා. අවම වශයෙන් රු. 20 ක කොටසකට සාමාජිකයෝ බඳවා ගන්නේ. සාමාජිකයෙකුගේ තැන්පත්වලින් විසි ගුණයක් තරම් මුදල් ඒ තරුණ තරුණියන්ට ණයට දෙනවා. දැන් අපි සාමාජිකයන් 300 කට පමණ රුපියල් දශ ලක්ෂයක් පමණ ණය දී තියෙනවා. නොයෙක් ව්‍යාපෘති ආරම්භ කරන්න. එම ව්‍යාපෘතිවලින් සියයට 60 ක් පමණ සාර්ථක වී තිබීම සතුටට කරුණකි. මෙම ණයදීමේ තවත් වැදගත් අංශය නම් එම ණයෙහි ඇපකරුවා එම ගමේම සිටින තරුණයෙක් වීමයි. එමගින් ණයගත් තරුණයා එම මුදල ව්‍යාපෘතියටම යොදවන බවට සහතිකයක් ලැබෙනවා. මොකද ණයකරුත්, ඇපකරුත් අතර පවතින විශ්වාසය නිසා නිස්කෝ සංවිධානේ වැඩ දිගටම හොඳින් කරගෙන යන්න පුළුවන් නම් අපිට පුළුවනි තව අවුරුදු 10 කින් විතර ප්‍රබල සංවිධානයක් බවට පත් කරන්න. අපි මේ සඳහා රජයේ මුදල් නොගෙන අපි නිස්කෝ සංවිධානයේ අරමුදල් වැඩි කිරීම සඳහා ලොතරැයි ක්‍රමයක් ඇතිකරලා තියෙනවා. දැනට ලොතරැයි පැවැත්වූවා. එමගින්



පාසැලෙන් පිටවූ විගස වෘත්තීය පුහුණුවක්

රුපියල් ලක්ෂ 25 ක් පමණ ලැබී තිබෙනවා. යනුවෙනි ලොතරැයිය කරගෙන යනවා. අපි මෙය කරන්නේ නීත්‍යානුකූලව, උතුම් පරමාර්ථයකින්. අත දීමට කිසිවෙක් නැති අපේ තරුණ පරපුරට අවස්ථාවක් ලබාදීමේ අදහසින්. මෙම ලොතරැයි ක්‍රමය ක්‍රියාත්මක වන්නේ තරුණ තරුණියන් වැඩිපුර ඇති සමුපකාර පැනමකින්. වෙනත් රටවල අත්දැකීම් අනුව, මේ ක්‍රමය සාර්ථක වන බවට විශ්වාසයි,

මෙම වැඩ පිළිවෙලටත් බාධක නැත්තේ නොවේ. ඉන් ප්‍රධාන ප්‍රශ්නය ලෙස රත්වත්තේ මහතා දකින්නේ, තරුණයින්ගේ ආකල්පයි. මීට පෙර අප පුහුණුවක් පමණක් ලබා දුන් කාලයේ බොහෝ දෙනා කීවේ ළමයින්ට හැකියාව තිබෙනවා. නමුත් මුදල් නෑ යන්නයි. දැන් 'නිස්කෝ සමුපකාර සමිතිය මගින් මුදල් ලබා දීමට පියවර ගෙන තිබියදී අපට පෙනී ගියා, තරුණ තරුණියන් එම මුදල් ලබාගෙන ව්‍යාපාර ආරම්භ කිරීමට බිය ගතියක් දක්වන බව. මේ සඳහා අපි ඔවුන් දිරිමත් කරන්න දැන් වැඩ පිළිවෙලක් ආරම්භකර තිබෙනවා. එබඳු ව්‍යාපෘති ජනප්‍රිය කිරීමට.

මෑත ලෝකයේ ජනප්‍රිය වී තිබෙන සාමූහික ක්‍රමය මගින් මෙම ක්‍රමය සාර්ථක කළ නොහැකිද? යන ප්‍රශ්නයට පිළිතුරු දුන් ඒ මහතා,

''ඒ ක්‍රමයට කළයුතු යයි අපිට බල කරන්නට බෑහැ. එය කළ හැක්කේ තරුණයන් කණ්ඩායම එවැනි ක්‍රමයකට කැමැති වූවොත් පමණයි. එහෙත් හම්බන්තොට ප්‍රදේශයේ සම්ප්‍රදායික මැටි කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතියකදී ණය දුන් විට එම තරුණ පිරිසට පෙනී ගියා සමූහිකව එම කටයුත්ත කළොත් වැඩි ලාභයක්


ලැබිය හැකි බව. ඒ අනුව එම එම සාමූහික ක්‍රමය සාර්ථක වුනා. ඒ නිසා ඒ අවබෝධය ඔවුන්ට ලැබිය යුතුයි''.

විශේෂයෙන් මහවැලිය වැනි අපේ සංවර්ධන ව්‍යාපාරවල දී තරුණයන්ට ලැබෙන තැන කුමක්ද? ''එවැනි ව්‍යාපාරවලදී අනිවාර්යයෙන්ම තරුණ තරුණියන්ට ප්‍රතිඵල ලැබෙනු සිකුරුයි. විශේෂයෙන්ම එම ව්‍යාපාරයේ දෙවන පරම්පරාව වෙනුවෙන් සුළු කර්මාන්ත ඇති කිරීමට ක්‍රියා කරගෙන යනවා''.

තුන්වැනි ලෝකය පුරා ඇති තරුණ ප්‍රශ්නයක්. එනම්, රටේ පාලනයට ප්‍රතිපත්ති සම්පාදනයට තරුණ පරපුර හවුල් කරගැනීම ගැන අදහසක්.

''මේ ප්‍රශ්නය ගැන සංඛ්‍යා බැලිය යුත්තේ සංඛ්‍යා ලේඛන ගුරු කොටගෙන නොවේ. ඒ අනුව සැළකුවත්, තරුණ පරපුරට අයත් කොටස් රාජ්‍ය පාලනයේ සෑම අංශයකම සිටිනවා. අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තුව, රාජ්‍ය සේවාව වැනි සෑම තැනකම සිටියත් තරුණ සංවිධානයක් වශයෙන් බලපෑම් කළහැකි දැයි කියන්න බැහැ. නමුත් එයට අපි ඇති කර තිබෙනවා, ජාතික මට්ටමේ තරුණ සම්මේලනයක්, එමගින් තරුණ අත් දැකීම්, අදහස් හා අභිලාෂයක් ඉදිරිපත් කිරීමට වේදිකාවක් ඇතිවනු ඇත. මෙය ප්‍රබල සංවිධානයක් බවට පත් කිරීම ජාත්‍යන්තර තරුණ වර්ෂයේ අපේ තවත් බලාපොරොත්තුවක්''

මේ හැරුණුවිට ජනතාව රටේ පාලනයට හවුල් කරගන්නා ග්‍රාමෝදය මණ්ඩල වලටත් යෞවන සමාජ? ''මුලින් ග්‍රාමෝදය මණ්ඩල ඇති කරනවිට අපි තීරණය කළා, යෞවන සමාජ එයට ඇතුළත් නොකිරීමට. මක්නිසාද, ග්‍රාමෝදය මණ්ඩල වලට බැඳීමේ අවශ්‍යතාවය නිසා යෞවන සමාජ ඇති කරයි යන බියෙන්. නමුත්, යම් යෞවන සමාජයක් එයට ඇතුලත් කළ යුතු යයි ප්‍රාදේශීය උප දිසාපතිවරයා සෑහීමකට පත් වන්නේ නම් එම සමාජයට උප දිසාපති වරයාගේ නම් කිරීමක් ලෙස ඇතුළත් වීමට අප ඉඩ දුන්නා. ලංකාවේ හොඳම ග්‍රාමෝදය මණ්ඩලය වන මැදගම ග්‍රාමෝදය මණ්ඩලයට එම ක්‍රමය යටතේ යෞවන සමාජය ඇතුළත් වී විශාල සේවයක් කරනවා. දැන් අපි සෑහීමකට පත්වී සිටිනවා, අපේ ක්‍රියාකාරීත්වය ගැන. ඒ නිසා අප කළ ඉල්ලීමක් අනුව යෞවන සමාජ ග්‍රාමෝදය මණ්ඩල වලට ඇතුලත් කිරීමට ගරු ඇමැතිතුමා තීරණය කර තිබෙනවා''.



ට්‍රැක්ටර් අලුත් වැඩියා කිරීමට පුහුණුවන තරුණයින් පිරිසක්.